# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,391 - 2024 ජුනි මස 28 වැනි සිකුරාදා - 2024.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 574 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 578 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූලි 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූලි 05 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

**කඩුවෙල මහා නගර සභාව**

2024 වර්ෂයේ පරිපූරක අයවැය ලේඛනය

කඩුවෙල මහා නගර සභාවේ 2024 වර්ෂය සඳහා වූ පරිපූරක අයවැය ලේඛනය 2024 ජුනි 28 වැනි දින සිට 2024 ජූලි මස 05 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ කඩුවෙල මහා නගර සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 214 වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

දිල්රුක්ෂි ගමගේ,
නාගරික කොමසාරිස් සහ බලතල කාර්යය
කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
කඩුවෙල මහා නගර සභාව.

2024 ජුනි මස 28 වැනි දින,
කඩුවෙල මහා නගර සභා කාර්යාලය,
කඩුවෙල.

06-197

---

සංශෝධනයයි

**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් සඳහා, විෂයභාර අමාත්‍යවරයාගේ විධානය නිවේදනය කිරීම සම්බන්ධයෙන් 2023.11.24 දින පළ කරන ලද අංක 2,360 *ගැසට් පත්‍රයේ* 11-508 නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් ලබා ගැනීම.**

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් එන්. ජී. එම්. පුෂ්පකුමාරි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 උප වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් සඳහා උතුරුමැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා විධානය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එන්. ජී. එම්. පුෂ්පකුමාරි,
ලේකම් හා බලතල කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරී.
මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
ඇලයාපත්තුව.

**විෂයභාර අමාත්‍යවරයාගේ විධානය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අලුත් තක්සේරුවක් හෝ සත්‍යෝක්ෂණයක් කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගත යුතු බවට 2023.05.17 දිනැති එන්සීපී/2023/05/17/10 අංක යටතේ තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම නුවරගම් පළාත බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපල මත අලුත් තක්සේරුවක් හා සත්‍යෝක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තියෙන් පැවරී ඇති

බලතල ප්‍රකාරව, උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යෙක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,<br>ආණ්ඩුකාරවර,<br>පළාත් පාලන විෂයභාර අමාත්‍ය,<br>උතුරුමැද පළාත,<br>අනුරාධපුර.

06-184

---

**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් එන්. ජී. එම්. පුෂ්පකුමාරි වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 උප වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2024 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.03.21 වැනි දින තීරණ අංක NCP/2024/03/21/05 යටතේ තීරණය කළ බව නිවේදනය කරමි.

එන්. ජී. එම්. පුෂ්පකුමාරි,<br>ලේකම් හා බලතල කාර්යය, කර්තව්‍ය<br>ක්‍රියාත්මක කරන නිලධාරී.<br>මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,<br>ඇලයාපත්තුව.

2024 මාර්තු මස 21 වැනි දින,<br>මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,<br>ඇලයාපත්තුව.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,243 හා 2021 අගෝස්තු මස 27 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාස වල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, නිශ්වල දේපළවල වාර්ෂික වටිනාකම සඳහා 2024 වර්ෂය සඳහා වූ තක්සේරුව 2024 වර්ෂය සඳහා තක්සේරුව ලෙස පිළිගැනීමටත්,

එම තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපළ මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට පහක් (5%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ලේකම් ලෙස මම තීරණය කරමි.

තව ද 2024 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ 2024 වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දින වලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (7) වන උපවගන්තියේ විධි විධාන යටතේ 2024 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද 2024 වර්ෂයේ ජනවාරි 31 වැනි දිනට හෝ එදිනට පෙර මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට පෙර මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වාරිපනම් බද්දේ ප්‍රමාණයෙන් (5%) වට්ටමක් ද ලබා දීමට මම තීරණය කරමි.

06-210

**මාතර මහා නගර සභාව**

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම පහත සඳහන් පරිදි වේ

මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 71(1) වගන්තිය හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2(1)(අ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදෙන අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නෙලුම් ඒ. ගමගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2024 පෙබරවාරි මස 28 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය* | *පළාත් පාලන ආයතනයේ නම* | *දිස්ත්‍රික්කය* | *වීථියේ වර්තමාන නම* | *අලුතින් යොදා ඇති නම* | *මාර්ග විස්තරය* |
|---|---|---|---|---|---|
| 01 | මාතර මහා නගර සභාව | මාතර | - | "නෙල්සන් කහකච්චි පටුමඟ" | ආරම්භය - බිලියන්ස්ටාර් පෙර පාසල<br><br>අවසානය - උපුල් මංගල මයාගේ නිවස |

06-198

---

සංශෝධනයයි

**මැදවච්චිය ප්‍රාදේශීය සභාව**

මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත බදු ප්‍රතිශතය සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය නිවේදනය කිරීම සම්බන්ධයෙන් 2023.12.08 දින පල කරන ලද අංක 2,362 12-161/1 නිවේදන පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

**මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත, වරිපනම් බදු ප්‍රතිශතය නිවේදනය කිරීම**

මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ ලේකම්, එස්. එම් සී. එස්. සී. සේමසිංහ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත සියයට හයක් (06%) ක වරිපනම් බද්දක් පනවා අය කිරීමට උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

එස්. එම්. එස්. සී. සේමසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
මැදවච්චිය ප්‍රාදේශීය සභාව.

**වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් ලේකම් වෙත ලැබී ඇති බලතල ප්‍රකාර මැදවච්චිය බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත වාර්ෂික වටිනාකමින් සියට හයක (6%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ ලේකම් එස්. එම්. එස්. සී. සේමසිංහ ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුර මැද පළාත,
අනුරාධපුර.

06-108/1

---

සංශෝධනයයි

**මැදවච්චිය ප්‍රාදේශීය සභාව**

මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත. බදු ප්‍රතිශතය සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය නිවේදනය කිරීම සම්බන්ධයෙන් 2023.12.08 දින පල කරන ලද අංක 2,362 දරන *ගැසට්* නිවේදනයේ අනු අංක 12-161/2 නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

**මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් ලබා ගැනීම**

මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ ලේකම්, එස්. එම් එස්. සී. සේමසිංහ වන මා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මැදවච්චිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් දේපළ මත නව තක්සේරුවක් සඳහා උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා විධානය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එස්. එම්. එස්. බී. සේමසිංහ,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරි,
මැදවච්චිය ප්‍රාදේශීය සභාව.

**විෂය භාර අමාත්‍යවරයාගේ විධානය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටුකරන මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අලුත් තක්සේරුවක් හෝ සත්‍යක්ෂණයක් කිරීමට 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබාගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වගන්තිය ප්‍රකාරව මැදවච්චිය බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අළුත් තක්සේරුවක් හා සත්‍යක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුර මැද පළාත,
අනුරාධපුර.

06-108/2

# විවිධ දැන්වීම්

## හපුතලේ නගර සභාව

### සේවා සඳහා ගාස්තු පැනවීම - 2024 වර්ෂය

255 වැනි අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 129, 130 හා 157(9) "ආ" වගන්තිවලින් හපුතලේ නගර සභාව වෙත පැවරී ඇති බලතල යටතේ හපුතලේ නගර සභාව 2024 වර්ෂයට අදාළව සපයනු ලබන සේවාවන්ට පහත සඳහන් ආකාරයට ගාස්තු අයවිය යුතු බවට 2024 වර්ෂයේ අප්‍රේල් මස 09 වැනි දින පවත්වන ලද හපුතලේ නගර කළමනාකරණ කමිටු රැස්වීමේදී පහත පරිදි සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**නම් මාරු කිරීම (පරිහරණ අයිතිය වෙනත් අයෙකුට පැවරීම) සම්බන්ධව ගාස්තු අය කිරීම**

| *අනු. අංකය* | *ස්ථාන පිහිටීම* | *2024.01.01 දින සිට ක්‍රියාත්මක වන ගාස්තුව (රු.)* |
|---|---|---|
| 01 | බස් නැවතුම් පොළ සාප්පු සංකීර්ණය (කඩ කාමර 26) | 100,000.00 |
| 02 | දඹේතැන්න පාර සාප්පු සංකීර්ණ (කඩ කාමර 26) | 100,000.00 |
| 03 | දඹේතැන්න පාර කඩ පේළිය (කඩ කාමර 25) | 100,000.00 |
| 04 | ෂර්වුඩ් පාර කඩ පේළිය (කඩ කාමර 23) | 50,000.00 |
| 05 | ජයවික්‍රම මාවත කඩ පේළිය ((කඩ කාමර 11) | 100,000.00 |
| 06 | දුම්රිය පොළ පාර (කඩ කාමර 11) | 50,000.00 |
| 07 | කොළඹ පාර (කඩ කාමර 16) | 100,000.00 |
| 08 | නව එළවළු තොග වෙළඳපොළ (බදුල්ල පාර කඩ 33) | 100,000.00 |
| 09 | ජයවික්‍රම මාවත (පදික කඩ 15) | 50,000.00 |
| 10 | ආතර් සිරිසේන මාවත (කඩ කාමර 25) | 50,000.00 |
| 11 | වෙනත් ව්‍යාපාර | 50,000.00 |
| 12 | නගර ශාලා සාප්පු සංකීර්ණය (කඩ කාමර 10) | 100,000.00 |
| 13 | පදික කඩ (කඩ කාමර 15) | 50,000.00 |

ලේකම්,
නගර සභාව,
හපුතලේ.

2024 වර්ෂයේ ජුනි මස 18 වැනි දින,
හපුතලේ නගර සභා කාර්යාලයේ දී ය.

06-185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.